Department of Education Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

# 19 පාඩම - සන්ධි

## ➢ ඉගනුම් ඵල :-

- පෙළ පොතේ නියමිත පඩෙම් හොඳින් අධ්‍යනය කරයි.
- පෙර උගත් පාඩම් ස්මරණය කරමින් ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- ලේඛන කාර්යය පහසු කර ගැනීම පිණිස සන්ධි පද භාවිතයට ගත හැකි බව වටහා ගනියි.

1. ඔබ සොයා ගත් පද විසන්ධි කිරීමට උත්සාහ ගන්න.
2. එක් එක් පදය විසන්ධි කිරීමෙන් පසුව ලැබෙන පද දෙකෙහිම අර්ථයක් ඇත්දැ'යි බලන්න.
3. ඔබ නමවන ශ්‍රේණියේ දී උගත් ස්වර, ව්‍යඤ්ජන වෙන් කිරීමේ අභ්‍යාසය නැවත කිරීමට උත්සාහ කරන්න.
4. එය සිහිපත් කරනු වස් පහත උදාහරණ බලන්න.

**ගෝ ⟶ ග්+ඕ, දී ⟶ ද්+ඊ, ක ⟶ ක්+අ**

5. එයට අනුව ඔබ කැමති අකුරු 5ක් පොතේ ලියන්න.
6. ඒවායේ ස්වර, ව්‍යඤ්ජන වෙන් කරන්න.
7. සන්ධි කාර්යය පහසු කර ගැනීම පිණිස ඉහත අභ්‍යාසය වන්නේ දැ'යි සිතන්න.
8. ඒ අනුව පහත සඳහන් පද වලට අදාළ සන්ධි පදය පෙළ පොතෙන් සොයා ලියන්න.

I. නිලුපුල් - ...........................................................
II. මැතින් - ...........................................................
III. සිහිනිඟ - ...........................................................
IV. ගිනියම් - ...........................................................
V. දිනිසුරු - ...........................................................
VI. සුරිඳු - ...........................................................
VII. නුවඟන - ...........................................................
VIII. පන්සාළිස් - ...........................................................
IX. ගම්පොල - ...........................................................
X. තුනුවග - ...........................................................
XI. සුරඟන - ...........................................................

- **ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි පොත පත :-**
  - ව්‍යාකරණ විවරණ (මුණිදාස කුමාරතුංග)
  - සිදත් සඟරාව

__පැවරුම__

❖ පහත දැක්වෙන වාක්‍යය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වචන නරහන් තුළින් තෝරා ලියන්න.

I. ................................ කාර්යය පහසු කර ගැනීම පිණිස සන්ධි පද භාවිත කරයි.

II. ලොප් කිරීමෙන්, ආදේශ කිරීමෙන් සහ................................කිරීමෙන් සන්ධි පද සාදාගත හැකිය.

III. සන්ධි කිරීමේ දී පෙර පදයේ................................ අකුර හා................................ පදයේ මුල අකුර ගළපා ගත යුතුය.

IV. පෙර පදයේ අග ස්වරය ලොප් කර පසු පදයේ මුල අකුර ගළපා සාදා ගනු ලබන සන්ධිය................................ නම් වේ.

V. සඤ්ඤක අක්ෂරයක හල් අකුර හා ස්වරය ලොප් කර ගළපන සන්ධිය................................ නම් වේ.

**(අග, පූර්ව ස්වර ලෝප සන්ධිය, පර, ලේඛන, ආගම, ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය)**